www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාක මහජනතාව ආරක්ෂා කරනු!

**Defend the Iraqi masses**

**කර්තෘ මන්ඩලය විසිනි**
**2004 අප්‍රේල් 8**

ඉරාක ජනතාවගේ ආරක්ෂාව සඳහා පෙරට පැමිනීම, ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ වගකීමකි. ඉරාකයේ සිදුවන්නේ, එක් අතකින් විජිතවාදී මර්දනයට එරෙහි වීරෝධාර වූත් යුක්තියුක්ත වූත් දේශව්‍යාප්ත නැගී සිටීමකි. අනෙක් අතින්, ඉරාක ජනතාව රුධිරයෙහි ගිල්වා ඔවුන් එක්සත් ජනපද පාලනයට නතු කර ගැනීම සඳහා බිය වද්දනු වස් බුෂ් පරිපාලනය හා ඇමරිකානු හමුදා විසින් දැරෙන මිනීමරු ප්‍රයත්නයකි.

ඉරාකයෙන් වැඩි කොටසක් කැරැල්ලෙන් ඇලලී ඇත. එක්සත් ජනපදය විසින් පූජක මොක්ටාඩා අල්-සදාර් නීති-විරෝධියකු කරනු ලැබීමෙන් ප්‍රකුපිත ෂියායිට් කැරැල්ල දැන් බැග්ඩෑඩ් නගරයෙන් මහත් ප්‍රමානයක් ද දකුනු ඉරාකයේ යුප්‍රටීස් හා ටයිග්‍රිස් ගංගා අතර සියලු ප්‍රධාන නගරයන් ද අල්ලා ගෙන ඇත. බහුතරයක් සුන්නි මුස්ලිම්වරුන් වෙසෙන ෆලූජා හා රමාඩි නගර වටලා ඇති අතර එක්සත් ජනපද නාවුක භටයන්ගේ මාරාන්තික ප්‍රහාරවලට ඔවුහු රුදුරු ලෙස ප්‍රතිරෝධය පාති. බැග්ඩෑඩයේ, ටික්රිට් බඳු මධ්‍යම ඉරාකයේ නගරයන්හි, කර්කුක් නම් උතුරු නගරයෙහි සුන්නි ප්‍රදේශ සිසාරා පෙලපාලි හා සටන් පුපුරා ඇත.

ධවල මන්දිරය, මෙම නැගිටීමට සහභාගි වන්නන් "මැරයන්", "මිනීමරුවන්", "සුලුතර අන්තවාදීන්" හා "ත්‍රස්තවාදීන" ලෙස විවිධාකාරයෙන් හඳුන්වා ඇත. මෙය තුච්ඡ බොරුවකි. එක්සත් ජනපද ආක්‍රමනික හමුදා අභිමුඛ ව ඇත්තේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ වසරක් දිගු පාලනයේ, සදාම් හුසේන්ගේ බාත්වාදී තන්ත්‍රයට වඩා හොඳක් නොදුටු ඉරාකයේ නාගරික දුප්පතුන්ගේත් අතිශය පීඩිතයන්ගේත් ව්‍යාපාරයකට ය. වයස අවුරුදු 13 තරම් තරුන ඉරාකයෝ සිය අතට අසුවූ මොන යම් ම හෝ ආයුධයක් ගෙන සටන් වැදී සිටිති. වර්තමාන තත්වය ෂියායිට් ඉරාකයන් විසින් සසඳනු ලබන්නේ බ්‍රිතාන්‍යයට එරෙහි 1920 නැගිටීමටත් හුසේන් පෙරලා දැමීමට වූ 1991 නැගිටීමටත් ය.

වර්ධනය වෙමින් පවතින සුන්නි හා ෂියායිට් වරුන්ගේ පොදු අරගලය, බුෂ් පරිපාලනයට විනාශය ගෙන එන දේශපාලන පහරකි. ආක්‍රමනයේ සිට ම, ඉරාක ජනතාව නිකායික හා වාර්ගික රේඛා දිගේ බෙදීමටත් ඉරාකය අල්ලා ගැනීම අත් හල හොත් එය සිවිල් යුද්ධයක් පැන නැගීමට තුඩු දෙනු ඇතැයි යන භීතිය දල්වාලීමටත් එක්සත් ජනපදය දැරූ ප්‍රයත්න මෙම පොදු අරගලය මගින් සිඳ බිඳ දමා ඇත.

අවම වසයෙන්, මෙම ජනවර්ගයන් එකට ජීවත්වන බැග්ඩෑඩයේ සුන්නි හා ෂියායිට් තරුනයෝ දැන් එක්සත් ජනපද හමුදාවලට එරෙහි ව එකට සටන් වදිමින් සිටිති. සියලු ඉරාකයන්ගේ එකමුතුව සඳහා අල්-සදාර් කල ඍජු කැඳවුමට ප්‍රතිචාර වසයෙන්, ඔහුගේ "මෙහ්දි හමුදාව" හා ෆලූජා සහ අන්තැන්වල ප්‍රතිරෝධය දක්වන සංවිධාන අතර සබඳතා ස්ථාපිත වූ බව සැල ය.

මෙම නැගිටීමෙහි ප්‍රධාන දේශපාලන කථිකයා වූද, සිය පවුල බාත්වරුන්ගේ ඝාතනයට ලක් වූවා වූද, සදාර් ඉරාක නැගිටීමට සහාය දක්වන ලෙස ඇමරිකානු ජනතාවගෙන් ඍජු ඉල්ලීමක් ද කලේ ය.

ෆලූජාවට එරෙහි එක්සත් ජනපද හමුදාව ගෙන යන ව්යරු ප්‍රහාරයට සමාන ම වර්ගයේ ප්‍රහාරයකට ඔහුත් ඔහුගේ දහස් ගනන් ආධාරකරුවනුත් සූදානම් වෙමින් සිටින නජාෆ් හි සිට සදාර් ඊයේ මෙසේ ප්‍රකාශ කලේ ය: "ඔබේ පාලකයන්ගේත් ආක්‍රමනික හමුදාවලත් අයුක්තියට පාත්‍රව සිටින ඔබේ සහෝදරයන් වූ ඉරාක ජනතාව පසෙකින් නැගී සිට අවංක ඉරාකීයන්ට බලය මාරු කර ගැනීමට උදව් කාරක වන ලෙස මම ඇමරිකානු ජනතාවට ආයාචනා කරමි. එසේ නොවුනොත් ඉරාකය, ඇමරිකාවට හා ආක්‍රමනිකයන්ට තවත් වියට්නාමයක් බවට පත් වනු ඇත."

සදාර්ගේ කැඳවුම, ඇමරිකානු දේශපාලන සංස්ථාපිතය තුල කිසිසේත් දක්නට නැති දේශපාලන පරිනතභාවයක මාත්‍රයක් ප්‍රදර්ශනය කරයි. එය බුෂ් පරිපාලනයේ හා ඇමරිකානු සංගත හිමි ප්‍රභුවේ පිලිවෙත්වල ගොදුරු බවට පත් දෙපාර්ශවයේ ම, ඉරාක ජනතාවගේ හා ඇමරිකානු කම්කරු පන්තියේ වෛෂයික පොදු උවමනාවන්ට කෙරෙන ඍජු ආමන්ත්‍රනයකි. එක්සත් ජනපද මාධ්‍ය ප්‍රචාරකයන්ට විපරීතව, ඇමරිකානු කම්කරු පන්තියේ බහුතරය අතර ඉරාක ආක්‍රමනයට පොදු සහයෝගයක් නැත.

එක්සත් ජනපද හමුදා, නැගිටීම පොඩිපට්ටම් කරනු වස් ලේ වැකි මෙහෙයුම් ක්‍රියාත්මක කරත්දී මිලියන ගනන් ඇමරිකානුවෝ හිරියෙන්, කම්පනයෙන් හා පිලිකුලෙන් මිශ්‍රිතව බලා සිටිති. ඉරාක ජනතාව වෙත කඩා පාත් කෙරෙමින් පවතින වධ හිංසා, දෙවන ලෝක යුද්ධයේ දී නාසීන් කල දෑ සමගත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදය, වියට්නාමයේ විජිත විරෝධී අරගලයට එරෙහිව කල දෑ සමගත් සමාන ස්ථානයක් ගනී. පසුගිය

දින හතර තුල, ඇමරිකානු හමුදා පල්ලිවලට බෝම්බ දමා ඇතඃ මැෂින් තුවක්කු මගින් ගිලන් රථවලට වෙඩි තබා ඇතඃ යුද ටැංකි හා කාලතුවක්කු මගින් ජනාවාස ප්‍රදේශ විනාශ කර ඇතඃ ඉරාක මිනිසුන්, ගැහැනුන් හා ලමයින් දහස් ගනන් මරා දමා හෝ අංගවිකලභාවයට ඇද හෙලා හෝ ඇත.

අඟහරුවාදා සිට, ෆලුජාහි වැසියෝ ඇමරිකානු නාවික හටයන් දහස් ගනනකගේ යෝධ ප්‍රහාරයක් රඳවා ලූහ. නගරයේ මුලු මහත් හාත්පස ප්‍රදේශවල, නාවිකයන් හා ප්‍රතිරෝධ පෑ සටන්කාමීන් අතර දිග් ගැස්සුනු වීදි සටන් දක්නට ලැබින.

බදාදා අපරභාගයේ, එක්සත් ජනපද ගුවන්යානා මිසයිල් ප්‍රහාර එල්ල කල අතර රාත්තල් 500ක් බර බෝම්බ දෙකක් නගරයේ අබ්දෙල් අසීස් අල්-සමාරායි පල්ලියේ මිදුලට හෙලී ය. එහි අපරභාග යාඥා සඳහා මිනිසුන් රැස්වන බව කියැවේ. සිද්ධිය දුටු ඉරාක ජාතිකයෙකු කියා සිටියේ මිනිසුන් 40 ක් පමන ඉන් මරා දැමුනු බවයි. ජිනීවා සම්මුතිය සෘජුව ම උල්ලංඝනය කරමින් එක්සත් ජනපද නාවික හටයෝ අල්-මුආදිදි පල්ලියේ කුලුන මතට නැග ඉරාක සටන්කරුවන්ට වෙඩි තැබීම සඳහා එය වේදිකාවක් කර ගත්හ.

ෆලුජාහි ඉරාක තුවාලකරුවන් සංඛ්‍යාව හරියට ම නොදනී. කෙසේ වෙතත්, එක් ආරෝග්‍ය ශාලාවක ප්‍රකාශකයෙකු බදාදා අල් ජසීරා රූපවාහිනියට වාර්තා කලේ ගෙවුනු පැය 24 තුල එම රෝහල 200කට වඩා තුවාලකරුවන්ට ප්‍රතිකාර කල බවයි. අඟහරුවාදා රාත්‍රියේ, එක්සත් ජනපද ගුවන් ප්‍රහාර මගින් නගරයේ අඩු වසයෙන් මිනිසුන් 53 දෙනෙකු මරා දැමුනි. මෙයට රොකට් මගින් විනාශබත් වූ නිවෙසක සිටි එක් විස්තීර්න පවුලක සාමාජිකයන් 25ක් අන්තර්ගතය.

නගරය තුල එකම කැමරා කාර්ය මන්ඩලය සමග වැඩකරන අල් ජසීරා රූපවාහිනී වාර්තාකරු අහමඩ් මන්සූර්, එක්සත් ජනපද හමුදාවන්හි සාපරාධී හැසිරීම ද ෆලුජාහි මිනිසුන් මුහුන දී සිටින භයානක තත්වය ද විස්තර කෙරෙන හැඟුම්බර වාර්තා ඉදිරිපත් කොට ඇත.

මන්සූර් ඊයේ රාත්‍රියේ මෙසේ වාර්තා කලේ යඃ "තත්වය නරක අතට හැරෙමින් පවතී. තුවාලකරුවන් ගෙනයන ගිලන් රථයක්, එය වෛද්‍ය මධ්‍යස්ථානයට යමින් සිටින අතරේ ප්‍රහාරයට ලක් විය. ඇමරිකානු හමුදා නගරයේ ආරෝග්‍යශාලාවට යන මාර්ගය වසා දමා ඇති අතර ෆලුජාහි වීදිවල සියල්ලන්ම දැන් ඔවුන්ගේ ඉලක්ක බවට පත්ව ඇත. ඔවුහු මිනිසුන් පදිංචි අසල් ප්‍රදේශවලට පහර දෙමින් සිටිති. ෆලුජාහි පදිංචිකරුවෝ, 300,000ක් වෙසෙන මේ නගරය වැටලීමෙන් මුදා ගන්නා ලෙස අරාබි ලෝකයට මැදිහත්වන ලෙස ආයාචනා කරති. මේ මොහොතේ අරාබි නායකයින් කොහි සිටිත් දැයි ඔවුහු අසති."

නැගෙනහිර බැග්ඩෑඩයේ කම්කරු පන්තික දිස්ත්‍රික්කයන්හි ෂියා තරුනයන් හා ඇමරිකානු හමුදා අතර දින හතරක ගැටුම්වල දී සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් තුවාල ලබා ඇත. "සදාර් නගරය" අවට උපනගරවල ආරෝග්‍යශාලා දෙකක් වාර්තා කලේ බදාදා උදේ වන විට අඩු වසයෙන් 68 දෙනෙකු මියගිය බවත් 238 දෙනෙකු තුවාල ලබා ඇති බවත් ය. මෙයට ගැහැනුන් සහ ලමයින් සංඛ්‍යාවක් ද ඇතුලත් ය. දකුනු ඉරාක නගරවල මිය ගිය හා තුවාල ලැබූ සංඛ්‍යාව දිනෙන් දින ඉහල යමින් පවතී.

## එජ පාලක කවයන්හි අපේක්ෂාභංගත්වය

ෆලුජාහි පල්ලිය මත නැගී එල්ල කල ප්‍රහාරය අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතු යඃ කැරැල්ල මැඩලීමට දින හතරක් තිස්සේ ප්‍රයත්න දැරීමෙන් පසුව බුෂ් පරිපාලනය හා මිලිටරිය අපේක්ෂා භංගත්වයට පත් ව ඕනෑම දෙයක් කිරීමට සූදානම් අවස්ථාවකට එලැඹෙමින් පවතී.

දින දෙකකට වැඩියෙන් දරුනු සටන්වල යෙදීමත් එහිදී ඇමරිකානුවන් සෑහෙන සංඛ්‍යාවක් මරනයට හෝ තුවාලවලට බඳුන්වීමත් තිබිය දී ම නාවුක හටයන් වාර්තා කොට ඇත්තේ ඔවුන් තවමත් අල්ලා ගෙන ඇත්තේ ෆලුජා නගරයෙන් සියයට 25ක් පමනක් බව ය. අඟහරුවාදා රමාඩි නගරය අසල තනි ප්‍රතිරෝධය පෑමේ ප්‍රහාරයකින් නාවික හටයන් 12කින් යුත් මුලු කන්ඩායමක් අතුගා දැමින.

වීදිවල පෙලගැසෙන තමනට විරෝධී හා සතුරු වූ තරුන සමූහයන් වෙතට මෑනූ බරැති මැෂින් තුවක්කුවලින් සමන්විත යුද ටැංකි පේලියකින් විනා ඇමරිකන් හමුදාවන්ට සදාර් නගරයට ඇතුලු විය නොහැකි ය. ඊයේ රාත්‍රියේ, ෂියායිට් මිලීෂියාවේ අය උතුරු බැග්ඩෑඩයේ එජ හමුදාවන්ට ප්‍රහාර එල්ල කිරීම සඳහා සුන්නි සටන්කරුවන් සමග එක්වූහ.

වාඩි ලා ගත් හමුදා අත පැවති හජාෆ් නගරයේ පාලනය ඔවුන් අතින් ගිලිහුනු බව එජ ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් පිලිගෙන ඇත. අසල කූෆා නගරයේ ද නැගිටීම සිදුව ඇත. කර්බලා හා කුට් නගරවල සදාර්ගේ මිලීෂියාව විසින් පෝලන්ත හා යුක්රේන හමුදා සාර්ථක ලෙස මැඩලන ලද්දේය. ප්‍රාදේශික පොලිසි සිය වාහන කැරලිකරුවනට බාර දුන් අතර බොහෝ අවස්ථාවල දී තුමූ ද කැරැල්ලට එක් වූහ. ඉතාලි හමුදා නසිරියා නගරය තුල සිය ග්‍රහනය පවත්වාගෙන ඇත්තේ යම්තමිනි. සමාවාහි ජපන් හමුදා සිය බලකොටු තුලට පසුබැස ඇති අතර බ්‍රිතාන්‍ය හමුදා අමරා හා බස්රා හි මිලීෂියාවේ දිනපතා ප්‍රහාරයන්ට මුහුන දී සිටිති.

තත්වය පාලනයෙන් පිට පැනීම වේගවත් ය යන ජාත්‍යන්තර හඬ මධ්‍යයෙහි, ඉදිරි සති කීපය තුල ඉරාකය හැර යාමට නියමිතව සිටි ඇමරිකානු හටයන් 24,000ක් තරම් සංඛ්‍යාවකට ඔවුන් ඉරාකයේ තවදුරටත් රැඳී සිටිය යුතු බවට නව නියෝග නිකුත් කෙරෙමින් පවතී.

ඉරාක ජනතාවගේ ප්‍රතිරෝධයටත් ඇමරිකානු

අපරාජිතභාවය පිලිබඳ මිථ්‍යාවට ඔවුන් කර ඇති අභියෝගයටත් එජ මාධ්‍යවලත් දේශපාලන සංස්ථාපිතයේත් ප්‍රතිචාරය වී ඇත්තේ බුෂ් පරිපාලනය ඉරාකයේ රුධිර ස්නානයක් සිදු කිරීමට හමුදාවට අන කල යුතු යැයි ඉල්ලා සිටින භීතියක හා හිස්ටීරියාවක සංයෝගයකි.

*නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ කතුවැකියෙහි විලියම් සැෆයර් ඊයේ මෙසේ සඳහන් කර තිබිනි:

"ෆලූජාහි කැරලිකාර බාත්වාදීන් සංසිඳුවන බවට ප්‍රකාශ කිරීමෙන් ඉක්බිති අපි ෆලූජාව සංසිඳුවිය යුතු ය. ෂියායිට් සදාර් සාපරාධියෙකු ලෙස නම් කිරීමෙන් පසුව, හමුදා බලයන්ට අවශ්‍ය ඕනෑම දෙයක් දී, අවසානයේ තුවාලකරුවන් අඩු සංඛ්‍යාවක් වන සේ ඔහුගේ ලේ වැකි අභියෝගයට අප පිලිතුරු දිය යුතු ය."

*වොෂින්ටන් පෝස්ට්* හි විවරනකරුවකු වන ජෝර්ජ් විල් සිය තීරු ලිපියෙන් කියා සිටියේ එජ

"අධිරාජ්‍යය" ඉරාකයේ "ප්‍රචන්ඩත්වයේ ඒකාධිකාරයක්" ස්ථාපිත කල යුතුව ඇති බවය.

"බැග්ඩෑඩයේ සිටීම ගැන වාද විවාද කිරීමට දැන් පමා වැඩි ය. - සතුරු හමුදාවක වේගවත් සංහාරය - අධිරාජ්‍යයේ සාපේක්ෂ ලෙස සුන්දර අවධිය දැන් අවසන් ය. පාලන තන්ත්‍රය වෙනස් කිරීම, අත්පත් කර ගැනීම, ජාතිය ගොඩ නැගීම - එක් වචනයකින් කිවහොත් අධිරාජ්‍යය - ලේ වැකි ගනුදෙනුවකි. දැන් ඇමරිකානුවන්, ඉරාකයේ නාගරික මිලීෂියාවන් ආයුධ රහිත කිරීමට හෝ පරාජය කිරීමට හෝ අවශ්‍ය ප්‍රචන්ඩ ක්‍රියාවන්හි යෙදීමට තමන්ම ශක්තිමත් විය යුතු ය...."

එජ හමුදාව, සදාර්ට ඉදිරි ප්‍රහාරයක් දීමට සූදානම් වන බවට ඇඟවුම් කර ඇත. ජනරාල් මාක් කිමිට් ඊයේ පුවත්පත් සාකච්ඡාවකදී මෙසේ කීය: "අපි මෙහ්දි හමුදාව විනාශ කිරීමට ප්‍රහාර එල්ල කරන්නෙමු. එම ප්‍රහාර හිතා මතා නිශ්චිතව කෙරෙනු ඇති අතර ඒවා ජයග්‍රාහී වනු ඇත්තේ ය."

ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂක ජෝන් කෙරී, හමුදාව කරන ඕනෑම දෙයකට කල් තබාම ඔහුගේ සහයෝගීත්වය පල කර ඇත. ජෝර්ජ්ටවුන් විශ්වවිද්‍යාලයේ දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය: "ඉරාක පිලිවෙතට ප්‍රවේශවන්නේ කෙසේද යන්න ගැන නොඑකඟතා තිබුනේ වුව ද අපට පොදු යම් දෙයක් තිබේ. - ජාතියක් වසයෙන් අපේ හමුදාවන්ට ආධාර කිරීමටත් අවසානයේ දී ස්ථාවර ඉරාකයක් පිලිබඳ අපේ අරමුනටත් අපි සියල්ලන්ම එකට එක්සත්ව සිටිමු."

මෙම දාමරික ක්‍රියා පිලිබඳ ඩිමොක්‍රැට්වරුන්ගේ ආශීර්වාදයත්, බ්‍රිතාන්‍යයේ ටෝනි බ්ලෙයාර්, ඉතාලියේ සිල්වියෝ බර්ලුස්කෝනි, ඕස්ට්‍රේලියාවේ ජෝන් හොවාර්ඩ් බඳු නායකයන්ගේ කතා සමග මැනවින් ගැලපෙයි: ඔවුහු හැම දෙනෙක් ම ඉරාකයේ "වැඩය අවසන් කිරීමට" කෙරෙන ඕනෑම දෙයකට ඔවුන්ගේ සහයෝගය ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර සිටිති.

බුෂ් පරිපාලනයේ හා එහි ජාත්‍යන්තර දේශපාලන මිතුරන්ගේ සාපරාධී ක්‍රියාවන් හමුවේ ජාත්‍යන්තර කම්කරු පන්තියට අකර්මන්‍ය ලෙස පැත්තකට වී බලා සිටිය නොහැකි ය.

එජය හා අන් ආක්‍රමනික හමුදා විසින් ඉරාකයේ සිදු කරන දාමරික ක්‍රියාවන්ට විරුද්ධව ලොව පුරා විරෝධතා රැලි සංවිධානය කරන ලෙසත් එමගින් තමන්ගේ දේශපාලන අනාගතය නිර්නය කිරීමට මූලික අයිතිය තමන් සතුව ඇති ඉරාක මහජනතාව සමග සෑම තැනකම සිටින කම්කරු ජනයාගේ සහයෝගීත්වය ප්‍රදර්ශනය කරන ලෙසත් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කැඳවුම් කරයි. එහිදී ජන සංහාරයන්ට නැවතුම තබන ලෙසත් ඉරාකයෙන් සියලු ඇමරිකානු හා විදේශ හමුදා වහා ඉවත් කර ගන්නා ලෙසත් කෙරෙන ඉල්ලීම් නැගිය යුතු ය. යුද්ධය සැලසුම් කිරීමටත් සංවිධානය කිරීමටත් වගකිවයුතු සියල්ලන්ම මුලුමනින්ම එලිදරව්කොට නඩු අසා යුද අපරාධකරුවන් ලෙස ඔවුනට දඬුවම් කල යුතු ය.

සියල්ලට මත් වඩා, එජ අධිරාජ්‍යවාදයටත් එහි මිලිටරිවාදයේ, භූගෝලීය ආධිපත්‍යයේ, සහ විර්ත අල්ලාගැනීමේ ලේවැකි ක්‍රියාමාර්ගයන්ට එරෙහිව නිර්දය ලෙස පෙනී සිටින, අව්‍යාජ මහා ජන ව්‍යාපාරයක් එජය තුලත් ජාත්‍යන්තරවත් ගොඩ නැගිය යුතු ය.

© www.wsws.org